# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014 - පැරණි නිර්දේශය

### 2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල

### චිරන්තන සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය SINH E - 1025

**පළමුවන කොටසත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03.00 යි.

---

අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩුකරනු ලැබේ.

I කොටස

01. (අ) පහත සඳහන් ජේදය ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය පැහැදිලි කර දක්වන්න.

උන් සතර දෙනා අතුරෙන් දකුණු වාසලින් නික්මුණු අමාත්‍යයා, දකුණු යව මැදුම් ගමැ මහ බෝසතාණන් වහන්සේ මැටි ඇරගෙන කුඹල් ආචාරීනට සක වටා මැටි වැකුණු ඇඟින් ම පිදුරු බිස්සෙක හිඳ මිටි මිටි කොට ගෙන යව සාලේ බත් අනුභව කරන්නවුන් දුටුයේ ය. "කුමක් පිණිස එබඳු දුකක් ගෙන කුඹල් කර්මාන්තය කළ සේක් දැ" යි යත හොත් "මහෞෂධ පණ්ඩිතයෝ මහා නුවණැත්තෝ ය, නිසැකයෙන් රාජ්‍යය ගන්නාහ" යි සැකයක් රජ්ජුරුවෝ කොළෝ නම් කුඹල් කර්මාන්තය කොට ජීවත් වනු අසා සැක නොවන්නාහ' යි සිතා මේ කාරණය පිණිස මෙ බඳු දුකක් ගත් සේක. මහ බෝසතාණන් වහන්සේ රජ්ජුරුවන්ගේ අමාත්‍යයා දැක තමන් වහන්සේ කැඳවා ආ බව දැන, " මාගේ සම්පත පෙර පරිද්දෙන් ම වන්නේ ය. අමරා දේවීන් විසින් ඉදි කරන ලද අනැගි රස මසවුළෙන් යුක්ත වූ බත් අනුභව කෙරෙමි" යි සිතා අතින් ගත් බත් පිඩ හෙළා නැගී සිට, අත කට සෝධා පියා සිටි සේක. ඒ ඇසිල්ලේහි ම අමාත්‍යයා ළඟට ගියේ ය.

ලකුණු 10 (6+4)

(ආ) පහත දැක්වෙන පද්‍ය පන්තියේ අදහස ලිහිල් බසින් ලියා සංක්ෂිප්ත රසාස්වාදයක් කරන්න.

කෙළනා බිඟුරැවින් බුදුමතුරු දපමින
සි රි නා තුරු වෙහෙර අතු අතිනි මල් ගෙන
ය ති නා යක එහිමි බුදුබව ලබන දින
සි රි නා වැනිය පිට දෙන ලෙසට පතමින

අ සා නිති සඟන පවසන දහම් කඳ
තොසා වෙමින් එවෙහෙර හුන් පරෙවි සොඳ
ව සා මුව පියෙන් දැවවළලු පිට ඉඳ
දෙ සා බලන වැනි උතුනට කරති නද

| | |
|---|---|
| දූ ටු ස ත   සිත සතුටු වන ලෙසට | නිතියෙනි |
| ස ත ර ත   එකට සම කැරූ බෙර ඇසක් | මෙනි |
| පැහැප ත   සුද නොහළ වැලි අතුළ මළු | තැනි |
| ශ්‍රී හි ක ත   සඳනලෙව් දුන් උරමඬල | වැනි |
| ස ස ර   එ තෙ ර   වන ලෙස වඩන | අදහස |
| නොහැ ර   වෙහෙර   රැඳි සඟගණගේ | සකස |
| නි තො ර   ස ත ර   සිල් කඳ ගෙන සිටින | ලෙස |
| ස ත ර   ප වු ර   බබළයි සිට සතර | දෙස |

ලකුණු 10 (6+4)

## II කොටස

02. උම්මග්ග ජාතකයෙන් පිළිබිඹු වන බ්‍රාහ්මණ විරෝධී ආකල්පය පිළිබඳ විමසීමක් කරන්න.

03. ස්වභාව සෞන්දර්යය වර්ණනයෙහි ලා හංස කවියා දැක්වූ සුවිශේෂ සාමර්ථ්‍යය පැහැදිලි කරන්න.

04. "කුරුණෑගල යුගයේ ගද්‍ය සාහිත්‍යය විසිතුරු ලෙස පෝෂණය වූයේ පූජාවස්තු මුල්කර ගත් නිර්මාණවලිනි" විමර්ශනය කරන්න.

05. සිංහල පද්‍ය සාහිත්‍ය ඉතිහාසයෙහි ගම්පොළ අවධිය වැදගත් වන්නේ කවර කරුණු නිසාදැයි පැහැදිලි කරන්න.

06. "සිංහල සිව්පද කාව්‍යයේ ස්වර්ණ අවධිය කෝට්ටේ යුගයයි" පරීක්ෂා කරන්න.

## III කොටස

07. සිංහල භාෂාවේ අක්ෂර හෝඩිය හා ශබ්ද හෝඩිය වෙන වෙනම විග්‍රහ කර දක්වන්න.

08. භාෂා ද්විරූපතා (Diglossia ) සංකල්පය හඳුන්වා, සිංහල භාෂා ද්විරූපතාව පැහැදිලි කරන්න.

09. 'උපභාෂා' යන්න හඳුන්වා සිංහල භාෂා සමාජයේ දැකිය හැකි සමාජීය උපභාෂා ලක්ෂණ පෙන්වා දෙන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.
    - i. උච්චාරණ ඉන්ද්‍රිය පන්තිය
    - ii. සිංහල භාෂාවේ ප්‍රාස්තාවික ස්වරූප
    - iii. සිංහලයේ අර්ධානුනාසික අක්ෂර
    - iv. අභ්‍යන්තර හා බාහිර සන්ධි
    - v. භාෂාව සහ සංස්කෘතිය

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)

**********************